# දකුණු පළාතේ සමුපකාර සමිති

# ශ්‍රේණිගත කිරීම හා කාර්යසාධන තරගාවලිය

# 2021/2022

## ධීවර සමුපකාර සමිති ඇගයීමේ නිර්ණායක

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

දකුණු පළාත

# දකුණු පළාතේ සමුපකාර සමිති ශ්‍රේණිගත කිරීම - 2021/2022

**හැඳින්වීම**

දකුණු පළාතේ සමුපකාර ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්ම සාධනය කරමින් ධනාත්මක අභිප්‍රේරණයන් සහිතව සංවර්ධනාත්මක ගමනකට දිශාගත කරනු පිණිස කාර්යක්ෂම හා ඵලදායි සමුපකාර සමිති ඇගයීම පිණිස දකුණු පළාත් සමුපකාර අමාත්‍යාංශයේ උපදේශකත්වය යටතේ දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව ක්‍රියාවට නංවන වැඩසටහනකි.

**මූලික කරුණු**

- දකුණු පළාත තුළ මෙම ශ්‍රේණිගත කිරීම හා කාර්යසාධන තරඟාවලිය තෙවන වරට සංවිධානය කරනු ලැබේ.
- ඇගයුම් කිරීම 2022 වර්ෂය පදනම් කර ගනිමින් 2024 වර්ෂයේදී සිදු කරනු ලැබේ.
- අයදුම්පත් නිවැරදිව, පැහැදිලිව හා විධිමත්ව ඉදිරිපත් කිරීම ඇගයුම් කටයුතු වලදී සැලකිල්ලට ගන්නා බැවින් ඔබගේ ප්‍රමුඛ අවධානය ඒ සඳහා යොමු විය යුතුය.
- දකුණු පළාතේ ලියාපදිංචි සියළුම සමුපකාර සමිති හා සංගම් මෙම ශ්‍රේණිගත කිරීම හා කාර්යසාධන තරඟාවලිය සඳහා තොරතුරු ඉදිරිපත් කල යුතුය.
- තොරතුරු ඉදිරිපත් කරන සියළුම සමිති ශ්‍රේණිගත කිරීම සඳහා අදාල කර ගන්නා අතර 2023.05.31 දින දක්වා වන මුදල් වර්ෂයට අදාලව සම්පූර්ණ අවසාන ගිණුම් සකස්කර එකී ගිණුම් දිස්ත්‍රික් සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කර ඇති සමිති කාර්යසාධන තරඟාවලිය සඳහා අදාල කරගනු ලැබේ.

සමුපකාර සමිති විසින් අත්පොතෙහි දක්වා ඇති නිර්ණායකයන්ට අනුව සනාථ කල හැකි තොරතුරු මත ස්වයං ලකුණු සටහන් කිරීමක් කල යුතුය. මෙම කාර්යය සඳහා ඔබ සමිතියේ වගකිවයුතු නිලධාරීන් හරහා සිදුකර ඔබ වෙත නිකුත්කර ඇති අයදුම්පත විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර 2024.04.30 දිනට පෙර ඉදිරිපත් කල යුතු අතර එහි නිවැරදි බව සහතික කරමින් සමිතියේ ගරු සභාපති හා සාමාන්‍යාධිකාරී /කළමණාකරු/ ලේකම් විසින්ම අත්සන් කල යුතුය.

**යෝජිත ඇගයුම් ක්‍රමවේදය**

**අදියර 01 -** සමුපකාර සමිති විසින් ලබාදෙන නිර්ණායකයන්ට අනුව ලකුණු සටහන් පොතෙහි පළමු තීරුවේ සටහන් කල තොරතුරු ඇගයුමට ලක්කෙරේ. එහිදී සමිතිය විසින් ඉදිරිපත් කරන සනාථ කිරීමේ ලේඛණ ඇතුළු අයදුම්පත නිවැරදිව හා විධිමත්ව සම්පූර්ණ කර තිබේදැයි පරීක්ෂා කර, සමිතියේ අවසන් විගණිත වර්ෂයද සලකා බලා දෙවන ඇගයුම් අදියරට සුදුසුකම් ලබන සමිති තෝරා ගනු ලැබේ.

**අදියර 02 -** පළමු ඇගයුමෙන් තෝරා ගන්නා සමිති භෞතිකව ඇගයුම මෙම අදියරේදී සිදුකෙරේ. මෙම ඇගයුම සඳහා සුදුසු පරිදි ඇගයුම් හා අධීක්ෂණ නිලධාරීන් සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් පත් කරනු ඇත. මෙම ඇගයුමේදී සමිතිය විසින් සටහන් කල ලකුණු ඇගයුම් නිලධාරීන් විසින් සත්‍යාපනය කරනු ලැබේ. එහෙත් ලකුණු එකතු කර සමිතිය ලැබූ මුළු ලකුණු සංඛ්‍යාව මෙහිදී ගණනය නොකරන අතර ලකුණු සටහන් පොත හා අදාල ලේඛණ සමිති නිලධාරීන් ඉදිරියේ විධිමත්ව මුද්‍රා තබනු ලැබේ.

**අදියර 03 -** මුද්‍රා තබන ලද ප්‍රතිඵල ලේඛණ මුද්රා ඉවත් කර ලකුණු එකතු කර ප්‍රතිඵල ලේඛණ සකස් කිරීම මෙහිදී සිදුවේ. මෙම අදියර සඳහා ඇගයුම් හා අධීක්ෂණ නිලධාරීන් සුදුසු පරිදි සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් පත් කරනු ඇත.

ශ්‍රේණිගත කිරීමට සමගාමීව කාර්යසාධන තරඟාවලිය පවත්වන්නේ නම් එක් එක් අංශයේ සම්මාන සඳහා තෝරාගන්නා සමිති යළි ඇගයීමක් සිදු කරන අතර එම ඇගයීම මත හේතු පාඨ සැකසීම, වීඩියෝගත කිරීම ඇතුළු කටයුතු සිදු කෙරේ. මෙම අදියරේදී තෝරා ගන්නා සමිති සම්බන්ධ තොරතුරු (ප්‍රතිඵල) සම්මාන දින දක්වා රහස්‍යව තැබෙනු ඇත. එම ඇගයුම සඳහා දකුණු පලාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමාගේ මූලිකත්වයෙන් වන කමිටුවක් මඟින් සිදු කෙරේ.

මෙම ශ්‍රේණිගත කිරීමට අදාල පදනම වන්නේ ව්‍යවස්ථාපිත විගණනය සඳහා 2022වර්ෂයට (2023.05.31 දක්වා) අදාලව ඔබ සමිතිය විසින් සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලයට ඉදිරිපත් කර ඇති අවසාන ගිණුම් වේ. එහෙත් යම් සමිතියක් 2022 වර්ෂයට අදාල අවසාන ගිණුම් ඉදිරිපත්කර නොමැතිනම්, ඒ සඳහා 2021 වර්ෂයට අදාල අවසාන ගිණුම්ද, 2021 වර්ෂයට අදාල අවසාන ගිණුම් ඉදිරිපත් කර නොමැත්තේ නම් 2020 වර්ෂයට අදාල අවසාන ගිණුම් ද, මෙම ශ්‍රේණිගත කිරීම සඳහා යොදා ගැනීමට අවස්ථාව ඇත. 2021 වර්ෂයට අදාල අවසාන ගිණුම් පදනම් කර ගන්නේ නම් මුළු ලකුණු සංඛ්‍යාවෙන් ලකුණු 100 ද, 2020 වර්ෂයට අදාල අවසාන ගිණුම් පදනම් කර ගන්නේ නම් මුළු ලකුණු සංඛ්‍යාවෙන් ලකුණු 200 ද අඩු කරනු ලැබේ. 2020 වර්ෂයට පෙර වර්ෂයක් අදාල කර ගන්නේනම් මුළු ලකුණු සංඛ්‍යාවෙන් ලකුණු 300 අඩු කරනු ලැබේ.

| කාර්යය | යෝජිත කාලය |
|---|---|
| නිර්ණායක හා අයදුම්පත් පොත් සකසා මුද්‍රණය | **2024.03.30** |
| අයදුම්පත් කැඳවීම | **2024.04.05 – 2024.04.30** |
| විනිශ්චය මණ්ඩල පත්කිරීම හා දැනුවත් කිරීම් | **2024.04.16-2024.04.30** |
| ඇගයුම අදියර 01 | **2024.08.01 -2024.09.18** |
| ඇගයුම අදියර 02 | **2024.09.19 - 2024.10.18** |
| ප්‍රතිඵල සමාලෝචනය | **2024.10.18-2024.11.08** |
| ප්‍රතිඵල නිකුත් කිරීම | **2024.12.06** |

වර්ගීකරණය හා ලබාගත යුතු අවම ලකුණු මට්ටම

| | |
|---|---|
| A ශ්‍රේණිය | - මුළු ලකුණු 800 වැඩි |
| B ශ්‍රේණිය | - මුළු ලකුණු 600-799 අතර |
| C ශ්‍රේණිය | - මුළු ලකුණු 450-599 අතර |
| D + ශ්‍රේණිය | - මුළු ලකුණු 350-449 අතර |
| D ශ්‍රේණිය | - මුළු ලකුණු **350** අඩු |

***** A ශ්‍රේණිය ලබා ගැනීමේදී අපේක්ෂිත ලකුණු 1000 නිරූපනය වන A,B,C යන කොටස් 03න් සෑම අංශයකින්ම 50%කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.**

***** යම් සමිතියක් මෙම ශ්‍රේණිගත කිරීම සඳහා ඉදිරිපත් නොවීම,නිවැරදි තොරතුරු සැපයීම පැහැර හැරීම හෝ අධීක්ෂණය සඳහා අවස්ථාව ලබා නොදීම යන අවස්ථා වලදී ඔවුනට D ශ්‍රේණිය හිමිවනු ඇත.**

අයදුම්පත් ඉදිරිපත් කල යුතු ආකාරය -

දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන නිර්ණායක අත්පොත අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත හා අදාල ඇමුණුම් 2024.04.30 දිනට පෙර ලැබෙන සේ සමිතිය අයත් දිස්ත්‍රික්කයට අදාල සහකාර කොමසාරිස් කාර්යාලයට ගෙනවිත් භාර දීම හෝ ලියාපදිංචි තැපැල මඟින් යොමු කල යුතුවේ. ඔබ විසින් ඉදිරිපත් කරන අයදුම්පත හා අදාල අමුණුම් අඟල් 15x10 ප්‍රමාණයේ ලිපි කවරයක බහා මුද්‍රා තබා එහි වම්පස ඉහළ කෙළවරේ **"සමුපකාර සමිති ශ්‍රේණිගත කිරීම -2021/2022- ධීවර"** ලෙස සඳහන් කල යුතුය.

# දකුණු පළාත් කාර්ය සාධන තරගාවලිය
# සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව දකුණු පළාත.
# කාර්ය සාධන තොරතුරු හා ලකුණු ලබා දීමේ පිළිවෙළ
# ධීවර සමූපකාර සමිති

**<u>හැඳින්වීම</u>**

සමූපකාර සමිතියකට ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව 1000 ක් වන අතර A සහ B හා C වශයෙන් මූලික අංශ තුනකින් කාර්ය සාධනය ඇගයීමට අපේක්ෂිතය. ලකුණු වෙන් කෙරෙන ආකාරය පහත දැක්වේ.

| | | |
|---|---|---|
| A සමූපකාර සමිතියේ ආර්ථික ස්ථායීභාවය | ලකුණු | 500 |
| B සමූපකාර සමිතියේ සාමාජික හා සමාජ සංවර්ධනය | ලකුණු | 300 |
| **C** නෛතික තත්වය | ලකුණු | 200 |
| **එකතුව** | | **1000** |

කාර්ය සාධනය ලක් කිරීමට A සහ B හා C යන මූලික අංශ දෙකෙහි අන්තර්ගතයන් හා ලකුණු බෙදා හැරීම හෙවත් බර තැබීම පහත සඳහන් පරිදි වේ.

| **A ආර්ථික ස්ථායීභාවය** | ලකුණු |
|---|---|
| 1. ලාභදායීතාවය | 80 |
| 2. හිමිකාරත්වය | 50 |
| 3. ද්‍රවශීලතාවය | 40 |
| 4. ආර්ථික තිරසාර බව | 40 |
| 5. කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය | 80 |
| 6. නව්‍යකරණය හා නිර්මාණකරණය | 30 |
| 7. මානව සම්පත් සංවර්ධනය | 40 |

| | |
|---|---|
| 8. භෞතික සම්පත් සංවර්ධනය/බාහිර පරිසරය | 40 |
| 9. කළමනාකරණය හා නායකත්වය | 50 |
| 10. අභ්‍යන්තර පාලනය | 50 |
| **එකතුව** | **500** |

| **B සාමාජික හා සමාජ සංවර්ධනය** | ලකුණු |
|---|---|
| 1. සමාජික සහභාගීත්වය | 80 |
| 2. සාමාජික ප්‍රතිලාභ (ආර්ථික) | 50 |
| 3. සාමාජික ප්‍රතිලාභ (සාමාජීය) | 30 |
| 4. ප්‍රජා සත්කාරය | 30 |
| 5. සමාජ වගකීම (ක්‍රියාකාරී බව ) | 30 |
| 6. සමූපකාර ගති ලක්ෂණ | 30 |
| 7. ආයතනික අරමුණු හා ප්‍රතිපත්ති ඉටු කිරීම | 50 |
| **එකතුව** | **300** |

| **C නෛතික තත්වය** | ලකුණු |
|---|---|
| 1. ආසන්නතම ගිණුම් වර්ෂයට විගණනය කර තිබීම හෝ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම | 40 |
| 2. සමිතියේ අඛණ්ඩ පැවැත්ම | 30 |
| 3. ශේෂ පත්‍රයේ සඳහන් මූල්‍ය වංචා සහ අවභාවිතයන් සඳහා නීත්‍යානුකූල පියවර ගෙන තිබීම | 25 |
| 4. විගණන විමසුම් හා උපදෙස් අනුව ක්‍රියාමාර්ග ගෙන තිබීම | 25 |
| 5. සමුපකාර පනත, අතුරු ව්‍යවස්ථා ඇතුළු නෛතික ප්‍රතිපාදනයන්ට අනුගත වීම | 30 |
| 6. සමුපකාර අරමුදල සඳහා ගෙවීම් කර තිබීම | 50 |
| **එකතුව** | **200** |

**ධීවර සමූපාකාර සමිතියෙහි ආර්ථික ස්ථායීභාවය - A කොටස**

සමූපකාර සමිතියේ ආර්ථික ස්ථායීභාවය ඇගයීමට අදාළ කරුණුවල විස්තරාත්මක නිර්ණායකයන් හා වෙන් කළ ලකුණු ප්‍රමාණයන් සවිස්තරව පහත ඉදිරිපත් කෙරේ.

(01)

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 01 ලාභදායිතාවය** | |
| A.01.01 මුළු වත්කම්වලට ශුද්ධ ලාභය ඉපයීම | 10 |
| A.01.02 ස්කන්ධයට ශුද්ධ ලාභය | 10 |
| A.01.03 ශුද්ධ ලාභ වර්ධනය | 10 |
| A.01.04 යෙදූ ප්‍රාග්ධනයට ශුද්ධ ලාභය ඉපයීමේ වර්ධනය | 10 |
| A.01.05 ශුද්ධ පොලී ඉපයීම | 10 |
| A.01.06 ශුද්ධ පොලී ඉපයීමේ වර්ධනය | 10 |
| A.01.07 පොලී ආදායම හා පොලී පිරිවැය | 10 |
| A.01.08 තැන්පත්වලට සාමාජික ණය | 10 |
| **එකතුව** | **80** |

(02)

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 02 හිමිකාරත්වය** | |
| A.02.01 මුළු වත්කම්වලට ස්කන්ධ දායකත්වය | 10 |
| A.02.02 මුළු වත්කම්වලට ආයතනික ප්‍රාග්ධනය | 10 |
| A.02.03 මුළු වත්කම්වලට කොටස් ප්‍රාග්ධනය | 10 |
| A.02.04 මුළු වත්කම්වලට සාමාජික ආර්ථික දායකත්වය | 10 |
| A.02.05 කොටස් අගය වර්ධනය | 10 |
| **එකතුව** | **50** |

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 03 ද්‍රවශීලතාව** | |
| A.03.01 මුළු වත්කම්වලට ද්‍රවශීල වත්කම් | 25 |
| A.03.02 මුළු තැන්පත්වලට ද්‍රවශීල වත්කම් | 15 |
| **එකතුව** | **40** |

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 04 ආර්ථික තිරසාර බව** | |
| A.04.01 මුළු වියදම් පියවා ගැනීමට මුළු ආදායම | 20 |
| A.04.02 මුළු වත්කම්වලට ආදායම් නොලබන වත්කම් | 20 |
| **එකතුව** | **40** |

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 05. කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය** | |
| A.05.01 මුළු ණය කළඹේ ඉපයීමේ ශක්තිය | 10 |
| A.05.02 මුළු තැන්පත්වලට රාශිකරණ පිරිවැය | 05 |
| A.05.03 මුළු වත්කම් වලට මෙහෙයුම් වියදම් | 05 |
| A.05.04 මුළු වත්කම්වලට ආදායම් නොලබන වත්කම් | 15 |
| A.05.05 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම | 20 |
| A.05.06 ආයතනයේ මූල්‍ය ස්ථාවරත්වය | 15 |
| A.05.07 ඵලදායිතාවය | 10 |
| **එකතුව** | **80** |

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 06 නව්‍යකරණය හා නිර්මාණකරණය** | |
| A.06.01 ආදායම් වර්ධනය සඳහා යොදා ඇති නව්‍යකරණය හා නිර්මාණකරණ වැඩසටහන් | 08 |
| A.06.02 පිරිවැය අවම කිරීමට යොදා ඇති නව්‍යකරණ හා නිර්මාණකරණ වැඩසටහන් | 08 |
| A.06.03 ආයතනික පරිසර සකස්වීමේ නව්‍යකරණ හා නිර්මාණකරණය | 08 |
| A.06.04 ආයතනික ප්‍රතිරූපය ගොඩනැඟීමට කළ වැඩසටහන් / ක්‍රමවේද | 06 |
| **එකතුව** | **30** |

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 07 මානව සම්පත් උපයෝජනය හා සංවර්ධනය** | |
| A.07.01 පිරිස්බල තක්සේරුව ක් තිබීම | 16 |
| A.07.02 සේවකයින් බඳවා ගැනීම විධිමත් කාර්ය පරිපාටිවලට අනුකූලවීම. | 10 |
| A.07.03 සමස්ත කාර්ය මණ්ඩලයෙන් වෘත්තීය පුහුණුව ලබා දීම | 07 |
| A.07.04 සේවක සමාජ සංරක්ෂණ නිති ක්‍රියාත්මක වීම | 07 |
| **එකතුව** | **40** |

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 08 භෞතික සම්පත් සංවර්ධනය** | |
| A.08.01 භෞතික සම්පත් සංවර්ධනය කර තිබීම | 10 |
| A.08.02 භෞතික සම්පත්වල ආරක්ෂාව සඳහා විධිවිධාන යොදා තිබීම | 14 |
| A.08.03 අනවශ්‍ය භෞතික සම්පත් බැහැර කිරීමේ ක්‍රියාදාමයක් පැවතීම | 16 |
| **එකතුව** | **40** |

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 09 කළමනාකරණය හා නායකත්වය** | |
| A.09.01 ව්‍යාපාරය තත්ත්ව විශ්ලේෂණය කර තිබිම | 05 |
| A.09.02 සංවිධානයේ දර්ශනය පිළියෙළ කර තිබීම | 05 |
| A.09.03 සංවිධානයේ දර්ශනය ප්‍රචලිත කර තිබීම | 05 |
| A.09.04 සංවිධානයේ මෙහෙවර පිළියෙළ කර තිබීම | 05 |
| A.09.05 සංවිධානයේ මෙහෙවර ප්‍රකාශනය ප්‍රචලිත කර තිබීම | 05 |
| A.09.06 අදාළ කාලයේ මහා සභා තීරණ ක්‍රියාත්මක විම | 05 |
| A.09.07 අදාළ කාලයේ අධ්‍යක්ෂ මණ්ඩල/ කාරක සභා තීරණ ක්‍රියාත්මක විම | 10 |
| A.09.08 මාණ්ඩලික නිලධාරීන්ගේ රැස්වීම් පවත්වා තිබීම | 05 |
| A.09.09 මාණ්ඩලික රැස්වීම් තීරණ ක්‍රියාත්මක කර තිබීම | 05 |
| **එකතුව** | **50** |

| විස්තරය | ලකුණු |
|---|---|
| **A. 10 අභ්‍යන්තර පාලනය** | |
| A.10.01 සමිතිය සංවිධාන ව්‍යුහයක් සකස් කර තිබීම හා ප්‍රදර්ශනය කර තිබීම | 02 |
| **A.10.02 සංවිධාන ව්‍යුහය අනුව බලතල හා වගකීම් පැවරීම** | |
| A.10.02.01 කාර්ය මණ්ඩල වෙත සේවා විභජන පත්‍ර ලබා දී තිබීම | 02 |
| A.10.02.02 කාර්ය සම්බන්ධ වගකිව යුත්තේ කාටදැයි යන්න පැහැදිලි වීම | 02 |
| **A.10.03 ගිණුම් පාලන ක්‍රම ස්ථාපිත වී තිබීම** | |
| A.10.03.01 දෛනිකව අත ඉතිරි සහතික සකස් කිරීම | 02 |
| A.10.03.02 දෛනිකව ගනුදෙනු තුලනය කිරීම | 02 |
| A.10.03.03 ගිනුම් කටයුතු සම්බන්ධ ද්වන්ධ පාලනය | 02 |
| A.10.03.04 කළමණාකරු හා කවුන්ටර් ලිපිකරුවන් අතර මුදල් හුවමාරුව ලිඛිතව සිදුවීම | 02 |
| A.10.03.05 මුදල්,උකස් භාණ්ඩ,.... ද්වන්ධ පාලනයට නතුව තිබීම | 02 |

| | |
|---|---|
| A.10.03.06 නිකුත් කළ ණය සඳහා කාරක සභා අනුමැතිය ලැබීම | 02 |
| **A.10.04 ශේෂ පිරික්සුම පිළියෙළ කිරීම** | |
| A.10.04.01 මාසිකව නිවැරදිව ශේෂ පිරික්සුම පිළියෙළ කිරීම | 02 |
| A.10.04.02 මාසයේ 10 දිනට පෙර ශේෂ පිරික්සුම පිළියෙළ කිරීම | 02 |
| A.10.04.03 පොදු ලෙජරයේ ශේෂයන්ගෙන් පිළියෙළ කර තිබීම | 02 |
| **A.10.05 ආදායම් ප්‍රකාශන පිළියෙළ කිරීම** | |
| A.10.05.01 ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව ආදායම් ප්‍රකාශන පිළියෙළ කර තිබීම | 02 |
| A.10.05.02 ගිණුම් සටහන් මගින් ගිණුම් විග්‍රහ කර තිබීම | 02 |
| **A.10.06 ශේෂ පත්‍රය පිළියෙළ කිරීම (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙළ කිරීම)** | |
| A.10.06.01 ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව පිළියෙළ කර තිබීම | 02 |
| A.10.06.02 ගිණුම් සටහන් මගින් ගිනුම් විග්‍රහ කර තිබීම | 02 |
| **A.10.07 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙළ කිරීම** | |
| A.10.07. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව පිළියෙළ කිරීම | 05 |
| **A.10.08 අභ්‍යන්තර පරික්ෂාව හා පාලන අදාළ කටයතු** | |
| A.10.08 අභ්‍යන්තර පරික්ෂාව හා පාලන අදාළ කටයතු | 10 |
| **A.10.11 පොත්පත් හා ලිපිගොනු භාරය** | |
| A.10.11.01 සමිතියේ පොත්පත් විෂය භාර අයගේ භාරයේ පැවතීම | 01 |
| A.10.11.02 සමිතියේ ලිපිගොනු විෂය භාර අයගේ භාරයේ පැවතීම | 01 |
| A.10.11.03 නීති කටයුතුවලට අදාළ පොත්පත් හා ලිපිගොනු විධායක නිලධාරියකුගේ භාරයේ ආරක්ෂා සහිතව තිබීම | 01 |
| **එකතුව** | **50** |
| **01-10 දක්වා ලකුණු එකතුව** | **500** |

## 1(A)කොටස -ලකුණු ලබා දීමේ උපදෙස් විස්තරාත්මක පැහැදිලි කිරීම්

**A.01.** ලාභදායීත්වය

**A.01.01** **මුළු වත්කම් වලට ශුද්ධ ලාභය ඉපයීම** (වෙන් කළ ලකුණු උපරිමය 10 කි.)

ශුද්ධ ලාභය X 100
මුළු වත්කම්

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**ලකුණු පදනම -** 6% ක් හෝ ඊට වැඩිනම් ලකුණු 10 කි. . ඊට අඩු මට්ටමක ප්‍රතිශත ළඟා වීම සඳහා සමානුපාතිකව ලකුණු හිමි වේ.

---

**A.01.02** **ස්කන්ධයට ශුද්ධ ලාභය** (වෙන් කළ ලකුණු උපරිමය 10 කි.)

ශුද්ධ ලාභය x 100
ස්කන්ධය

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**ස්කන්ධය = (කොටස් ප්‍රාග්ධනය + ඉතිරි ලාභය + සංචිත පරිත්‍යාග +ලාභයෙන් වෙන් කල අරමුදල් )**

ප්‍රමිතිය 20% කි.ඊට ළඟා වීම හෝ ඊට වැඩි ලකුණු 10 ක් හිමි වේ. ඊට අඩු අනුපාතයක් සඳහා සමානුපාතිකව ලකුණු හිමි වේ.

---

**A. 01.03** **ශුද්ධ ලාභ වර්ධනය** (වෙන් කළ ලකුණු උපරිමය 10 කි.)

**වර්ධන ශුද්ධ ලාභය x 100**
**පෙර වර්ෂයේ ශුද්ධ ලාභය**

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

වර්ධන ශුද්ධ ලාභය = මේ වර්ෂයේ ශුද්ධ ලාභය - වර්ෂයේ ශුද්ධ ලාභය

**ලකුණු පදනම -** ප්‍රමිත ප්‍රතිශතය10% කි. ඊට ළඟා වීම හෝ ඊට වැඩි ලකුණු 10 ක් හිමි වේ. ඊට අඩු අනුපාතයක් සඳහා සමානුපාතිකව ලකුණු හිමි වේ.

---

**A.01.04** **යෙදූ ප්‍රාග්ධනයට ශුද්ධ ලාභය ඉපයීමේ වර්ධනය.** (වෙන් කළ ලකුණු උපරිමය 10 කි.)

මෙම දර්ශකය මගින් සමස්ථ ශුද්ධ ලාභය ඉපයීම පෙර වර්ෂයට සාපේක්ෂව ලබා ඇති වර්ධනය සසඳා බලනු ලැබේ. ප්‍රමිත ශුද්ධ ලාභ ඉපයීමේ වර්ධනය 10% කි.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**ඉපයීමේ වර්ධන අනුපාතය x 100**
**පෙර වසරේ ඉපයීමේ අනුපාතය**

**ඉපයීමේ වර්ධන අනුපාතය = A 01-01 අනුපාතය (මෙම වර්ෂය) - A 01-01 අනුපාතය (පෙර වර්ෂය)**
ලකුණු පදනම - ලාභ ප්‍රතිශත වර්ධනය 10% හෝ ඊට වැඩි ලකුණු 10 යි. 10% ට අඩු වීමේ දි ප්‍රතිශතාත්මකව සමානුපාතිකව ලකුණු ලැබේ.

**A.01.05** **ශුද්ධ පොලී ඉපයීම** (වෙන් කළ ලකුණු උපරිමය 10 කි.)

$$\frac{\text{ශුද්ධ පොලිය} \times 100}{\text{පොලී ආදායම}}$$

පොලී ආදායම = ආයෝජන පොලිය සමඟ පොලී ආදායම
ශුද්ධ පොලිය = මුළු පොලී ආදායම -මුළු පොලී වියදම ( බාහිර ණය පොලී සමඟ)

ලකුණු පදනම -.ප්‍රමිතිය 20% ට අඩු වීම මත ප්‍රතිශතාත්මකව සාමානුපාතිකව ලකුණු හිමි වේ. වර්ධන ප්‍රතිශතය සෘණ (-) අගයක් ලැබීමේ දී ලකුණු හිමි නොවේ. ප්‍රතිශත වර්ධනය අතරමැදි තත්ත්වය මත ගණනය වූ නියමිත ලකුණු ලැබේ.

ලාභ වර්ධනය 40% ට වැඩි වන විට ද බර තැබූ පොලිය හා බර තැබූ ණය පොලී අතර පරතරය සලකා බැලේ. එය 6%ක් වන අතර ණය පරීක්ෂාකර බැලිය යුතු ය.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.01.06** **ශුද්ධ පොලී ඉපයීමේ වර්ධනය** (වෙන් කළ ලකුණු උපරිමය 10 කි.)

$$\frac{\text{ශුද්ධ පොලී වර්ධනය} \times 100}{\text{පෙර වර්ෂයේ ශුද්ධ පොලී වර්ධනය}}$$

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**ශුද්ධ පොලී වර්ධනය = මෙම වර්ෂයේ ශුද්ධ පොලිය - පෙර වර්ෂයේ ශුද්ධ පොලිය**
ප්‍රමිත ශුද්ධ ලාභ වර්ධනය 10% කි. ඊට අඩු වීම මත ප්‍රතිශතාත්මකව සාමානුපාතිකව ලකුණු හිමි වේ.

**A.01.07** **පොලී ආදායම හා පොලී පිරිවැය** (වෙන් කළ ලකුණු උපරිමය 10 කි.)

බර තැබූ ණය පොලී ආදායම හා බර තැබූ පොලී පිරිවැය අතර පරතරය ගණනය කෙරේ.
ප්‍රමිත මට්ටම 4% - 6%කි. ලකුණු ලබා දීම මෙසේය.

(ඇමුණුම 01 අනුව) බර තැබූ ආයෝජන හා ණය පොලිය - .......................
(අඩු කලා) බර තැබූ තැන්පත් පොලිය - .....................
පරතරය - ......................

| | | | |
|---|---|---|---|
| 4% - 6% දක්වා | ලකුණු 10 | 6% - 7% දක්වා | ලකුණු 08 |
| 7% - 8 %දක්වා | ලකුණු 06 | 8% වැඩිනම් | ලකුණු 04 |

**බර තැබූ පොලී පිරිවැය ගණනය කිරීම**

තැන්පත්

| තැන්පත් වර්ගය (1) | ............. දිනට ශේෂය (2) | මුළු වටිනාකමෙන් ශේෂයේ ප්‍රතිශතය (3) | පොලී ප්‍රතිශතය (4) | පොලී ප්‍රතිශතය සීයෙන් බෙදූ අගය (5) | බරිත අගය 3 x5 |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| එකතුව | | බර තැබූ තැන්පත් පොළිය (එකතුව) | | | |

ආයෝජන හා ණය

| ආයෝජන හා ණය වර්ගය (1) | ............. දිනට ශේෂය (2) | මුළු වටිනාකමෙන් ශේෂයේ ප්‍රතිශතය (3) | පොලී ප්‍රතිශතය (4) | පොලී ප්‍රතිශතය සීයෙන් බෙදූ අගය (5) | බරිත අගය 3 x5 |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| එකතුව | | බර තැබූ ආයෝජන හා ණය පොළිය (එකතුව) | | | |

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු 1 | විනිශ්චිත ලකුණු 2 |
|---|---|---|
| | | |

**A.01.08** <u>තැන්පත් වලට සාමාජික ණය</u> (වෙන් කළ ලකුණු උපරිමය 10 කි.)

මෙම දර්ශකය මඟින් තැන්පත් මත ණය ප්‍රදානය කළ ප්‍රමාණය ගණනය කෙරේ. ගණනය කරනුයේ පහත සඳහන් පරිදි ය. බාහිර ණය අදාල නොවේ.

**<u>මුළු ණය ශේෂය x 100</u>**
**මුළු තැන්පත් ශේෂය**

ලකුණු පදනම - ණය ප්‍රදානය 80% හෝ වැඩි ලකුණු 10
80% ට අඩු වීමේ දි ප්‍රතිශතාත්මකව සාමානුපාතිකව ලකුණු ලැබේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු 1 | විනිශ්චිත ලකුණු 2 |
|---|---|---|
| | | |

| A-1 කොටස මුළු ලකුණු 80 | සමිතිය | වි. 1 | වි. 2 |
|---|---|---|---|
| | | | |

**A.02.** **හිමිකාරත්වය.**

**A.02.01** **<u>මුළු වත්කම් වලට ස්කන්ධ දායකත්වය</u>** (වෙන් කළ ලකුණු උපරිමය 10 කි.)

**<u>ස්කන්ධය x 100</u>**
**මුළු වත්කම් (ශේෂ පත්‍රයේ එකතුව)**

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

ස්කන්ධය A 01.02 පරිදි වේ. ලකුණු ලබා දීමේ පදනම පහත දැක්වේ.
ප්‍රමිත ප්‍රතිශතය 20% කි. ඊට වැඩි නම් ලකුණු10 කි. 20% වඩා අඩුවීමේදී ලබාගත් ප්‍රතිශතය මත සමානුපාතිකව ලකුණු හිමි වේ.

**A.02.02** **<u>මුළු වත්කම්වලට ආයතනික ප්‍රාග්ධනය.</u>** (වෙන් කළ ලකුණු උපරිමය 10 කි.)

**<u>ආයතනික ප්‍රාග්ධනය x 100</u>**
**මුළු වත්කම් (ශේෂ පත්‍රයේ එකතුව)**

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**ආයතනික ප්‍රාග්ධනය = ස්කන්ධය - කොටස්**

ලකුණු පදනම - ප්‍රමිතිය 10% කි. ප්‍රතිශතය 10% ක් හෝ වැඩි නම් ලකුණු 10 කි. ඊට අඩු වන්නේ නම් ලබාගත් ප්‍රතිශතය මත සමානුපාතිකව ලකුණු හිමි වේ.

**A.02.03** **<u>මුළු වත්කම්වලට කොටස් ප්‍රාග්ධනය</u>** (වෙන් කළ ලකුණු උපරිමය 10 කි.)

ප්‍රමිත මට්ටම සී/ස සමිතියකට 10% කි. සී/ර සමිතියකට 5 % කි. ගණනය කරනුයේ පහත සඳහන් ආකාරයට ය.

**<u>කොටස් ප්‍රාග්ධනය x 100 (කොටස්වල වටිනාකම)</u>**
**මුළු වත්කම් (ශේෂ පත්‍රයේ එකතුව)**

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

ප්‍රමිත මට්ටම වෙනුවෙන් ලකුණු 10 කි. ලබාගත් ප්‍රතිශතය අනුව සමානුපාතිකව ලකුණු හිමි වේ.

**A.02.04** **<u>මුළු වත්කම් වලට සාමාජික ආර්ථික දායකත්වය</u>** (වෙන් කළ ලකුණු උපරිමය 10 කි.)

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

මෙමගින් මුළු වත්කම්වලට සාමාජික ආර්ථික සහභාගීත්වය ගණනය කෙරේ. ගණනය කරනුයේ පහත සඳහන් ආකාරයට ය.

**<u>(සාමාජික කොටස් + සාමාජික තැන්පත්+සාමාජිකයන් සෘජුව ගොඩනගාගත් ප්‍රාග්ධන අරමුදල) x 100</u>**
**මුළු වත්කම් (ශේෂ පත්‍රයේ එකතුව)**

ප්‍රමිත මට්ටම 50% කි. ඊට වැඩි නම් ලකුණු 10 කි. ලබාගත් ප්‍රමිත මට්ටම අනුව සමානුපාතිකව ලකුණු හිමි වේ.

A.02.05 **කොටස් අගය වර්ධනය**

වෙන් කළ ලකුණු උපරිමය 10 කි. මෙමගින් කොටසක සාමාන්‍ය පොත් අගය ගණන කෙරේ. කොටසක වටිනාකම රු. 100 ක් ලෙස සැලකිය යුතු ය.

**සාමාජික හිමිකම් (ස්කන්ධය) (A.01.02.පරිදි)**
**සාමාන්‍ය කොටස් සංඛ්‍යාව** (කොටස් වටිනාකම/100)

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

ලකුණු ලබා දීමේ පදනම පහත දැක් වේ.
ප්‍රමිත වර්ධන කොටසක අගය රු. 500 ක් හෝ වැඩි නම් ලකුණු 10 කි.ලබාගත් අගය මත සමානුපාතිකව ලකුණු හිමිවේ.

| A-2 කොටස මුළු ලකුණු 50 | සමිතිය | වි. 1 | වි. 2 |
|---|---|---|---|
| | | | |

A.03. දුවශීලතාවය

**A.03.01** **මුළු වත්කම්වලට දුවශීල වත්කම්** (වෙන් කළ ලකුණු උපරිමය 25 කි.)

**දුවශීල වත්කම් x 100**
**මුළු වත්කම්**

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

ලකුණු පදනම - ප්‍රමිත මට්ටම 10% - 15% අතර විය යුතුය.
5% ත් 10% ත් අතර ලකුණු ලකුණු 10 10% ත් 15% ත් අතර ලකුණු ලකුණු 25
15% ත් 50% ත් අතර ලකුණු ලකුණු 10 අතරමැදි මට්ටම නියමිත ලකුණු හිමි වේ.

**A.03.02** **මුළු තැන්පත්වලට දුවශීල වත්කම්** (වෙන් කළ ලකුණු උපරිමය 15 කි.)

**දුවශීල වත්කම් x 100** (බැංකු නියාමන 01/2013 චක්‍රලේඛනය අනුව)
**මුළු තැන්පත් (සාමාජික හා සමාජික නොවන තැන්පත්)**

ප්‍රමිත මට්ටම 20% විය යුතුය. 20% අඩුවන විට සමානුපාතිකව හිමිවේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

| A-3 කොටස මුළු ලකුණු 40 | සමිතිය | වි. 1 | වි. 2 |
|---|---|---|---|
| | | | |

**A.04** ආර්ථික තිරසාර බව

**A.04.01** මුළු වියදම් පියවා ගැනීමට මුළු ආදායම (වෙන් කළ ලකුණු උපරිමය 20 කි.)

**මුළු ආදායම x 100 ( ආදායම් ප්‍රකාශය අනුව)**
**මුළු වියදම ( ආදායම් ප්‍රකාශය අනුව)**

ප්‍රමිත මට්ටම 115% ට වැඩි විය යුතු ය. ඊට අඩු වීමේදී සමානුපාතිකව ලකුණු හිමි වේ. අවමය 100% කි

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.04.02** මුළු වත්කම්වලට ආදායම් නොලබන මූල්‍ය වත්කම් (වෙන් කළ ලකුණු උපරිමය 20 කි.)

**ආදායම් නොලබන ද්‍රවශීල වත්කම් x 100 ( අත ඉතිරි හා ජංගම ගිණුමේ ශේෂය)**
**මුළු වත්කම් (ශේෂ පත්‍රයේ එකතුව)**

ප්‍රමිත මට්ටම 0-1% කි. 1% - 5% දක්වා වඩා වැඩිවන විට සමානුපාතිකව ලකුණු අඩු වේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

| A-4 කොටස මුළු ලකුණු 40 | සමිතිය | වි. 1 | වි. 2 |
|---|---|---|---|
| | | | |

**A.05.** කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය

**A.05.01** මුළු ණය කළඹේ ඉපයීම් ශක්තිය (වෙන් කළ ලකුණු උපරිමය 10 කි.)

**ශුද්ධ පොලී ආදායම x 100 ( මුළු පොලී ආදායම - මුළු පොලී වියදම)**
**සාමාන්‍ය මුළු වත්කම්**

**සාමාන්‍ය මුළු වත්කම් = (වර්ෂයේ ආරම්භක මුළු වත්කම් + වර්ෂයේ අවසාන මුළු වත්කම්)**
**2**

ප්‍රමිත මට්ටම 8% කි. 8% වඩා වැඩිවන විට හා අඩුවන විට සමානුපාතිකව ලකුණු අඩුවේ.ලකුණු හිමිවන්නේ 01%-15% දක්වා පමණි.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.05.02** මුළු තැන්පත්වලට රාශිකරණ පිරිවැය (වෙන් කළ ලකුණු උපරිමය 05 කි.)

**තැන්පත් රාශිකරණ පිරිවැය x 100 ( තැන්පත් එකතුකිරීම සඳහා වැය)**
**වර්ෂයේ වර්ධනය වූ තැන්පත් ( සාමාජික හා සාමාජික නොවන)**

**වර්ෂයේ වර්ධනය වූ තැන්පත් = මෙම වර්ෂයේ මුළු තැන්පත් ශේෂය - පෙර වර්ෂයේ මුළු තැන්පත් ශේෂය**

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

ප්‍රමිත මට්ටම 1% කි. 1% වැඩිවන විට සමානුපාතිකව ලකුණු අඩුවේ. 1.5% වැඩිනම් ලකුණු නැත.
( තැන්පත් රැස්කිරීමේ විශේෂ වැඩ සටහන් සඳහා දරණ ලද වියදම් පමණක් අදාල වේ.)

**A.05.03** **<u>මුළු වත්කම්වලට මෙහෙයුම් වියදම්</u>** (වෙන් කළ ලකුණු උපරිමය 05 කි.)

**මෙහෙයුම් වියදම් x 100**
**සාමාන්‍ය මුළු වත්කම්** (A 05.01 පරිදි වේ. )

**මෙහෙයුම් වියදම් = මුළු පිරිවැය - ( වර්ෂය තුළ බොල් හා අඩමාන ණය + මුළු තැන්පත් පොලී+ බාහිර ණය පොලී....)**
ප්‍රමිත මට්ටම 4% කි. 4% වැඩිවන විට සමානුපාතිකව අඩු ලකුණු හිමිවේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**<u>මුළු වත්කම්වලට ආදායම් නොලබන වත්කම්</u>**

**A.05.04** වෙන්කළ ලකුණු උපරිමය 15 කි.

**කල් පසු ණයx 100**
**මුළු ණය කළඹ**

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

0% - 2% දක්වා ලකුණු 15 2% - 4% දක්වා ලකුණු 12
4% - 5% දක්වා ලකුණු 10 5% - 7.5% දක්වා ලකුණු 05

7.5 වැඩිනම් ලකුනු නැත. (බැංකු නියාමන චක්‍රලේඛ අංක 03/2013 පරිදිය.)

**<u>ආයතනයේ අඛණ්ඩ පැවැත්ම</u>**

**A.05.05** වෙන්කළ ලකුණු උපරිමය 20 කි.

**මුළු මූල්‍ය වත්කම් - මුළු මූල්‍ය වගකීම්** (මූල්‍ය තත්ව විශ්ලේෂණ වාර්තාව අනුව)
ලකුණු පදනම = අගය ධන වේ නම් උපරිම ලකුණු හිමි වේ. ඍණ වේ නම් ලකුණු නැත.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**<u>ආයතනයේ මූල්‍ය ස්ථාවරත්වය</u>**

**A.05.06** වෙන්කළ ලකුණු උපරිමය 15 කි. මෙහෙයුම් ක්‍රියාකාරිත්වය අනුව ලාභ වර්ධනය හා මුදල් හා මුදල් සමාන දැවල වර්ධනය පෙර වර්ෂය හා පදනම් වර්ෂය අනුව අගයනු ලැබේ.

ලකුණු පදනම - ලාභ වර්ධනය ධන වේ නම් ලකුණු 10 කි. මුදල් හා මුදල් සමාන දෑ වල වර්ධනය ධන වීම ලකුණු 05

ඌණතාවය අවම වීම මත ලකුණු 05 කි. (මූල්‍ය තත්ව විශ්ලේෂණ වාර්තාව අනුව)

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

<u>ඵලදායිතාව</u>

**A.05.07** නියමිත ලකුණු උපරිමය 10 කි. එස් 5 ක්‍රමවේද භාවිතය, තත්ව කව ක්‍රියාත්මක වීම අනුව භාවිතය හා ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කර ලකුණු ලබා දේ.

අනවශ්‍යා දේ ඉවත් කිරීම, අවශ්‍යා දේ පිළිවෙල , සේවා ස්ථානයේ පිරිසිදුකම, අඛණ්ඩ මනා පිළිවෙල, පාලන නීති හා පුහුණුව ආදිය සලකා බැලේ. සනාථ කිරීමේ ලේඛණ හා තොරතුරු ඉදිරිපත් කිරීමෙන් පසු සමස්ථය නිරීක්ෂණය කර විනිශ්චය මණ්ඩලය විසින් ලකුණු ලබා දෙනු ලැබේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

| A-5 කොටස මුළු ලකුණු 80 | සමිතිය | වි. 1 | වි. 2 |
|---|---|---|---|
| | | | |

**(06) නව්‍යකරණය හා නිර්මාණකරණය**

<u>ආදායම් වර්ධන වැඩසටහන්</u>

**A.06.01** වෙන්කල ලකුණු උපරිමය 08 කි.ආදායම් වර්ධනය සඳහා යොදා ඇති වැඩසටහන් වෙනුවෙන් ලකුණු ලබා දීම සිදු කෙරේ.ආදායම් වර්ධන නව්‍යකරණ වැඩසටහන් සහ නිර්මාණකරණ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති බව තහවුරු කළ යුතුවේ.

නව්‍යකරණ හෝ නිර්මාණකරණ වැඩසටහන් සඳහා එක් වැඩසටහනකට ලකුණු 04බැගින් උපරිමය ලකුණු 08කි. (නිරීක්ෂණ මට්ටමෙන් ලකුණු ලබා දිය යුතුය.පවත්වන ලද වැඩසටහනක් නිසා ආදායම් වැඩිවීම උපලේඛනයක් මඟින් සනාථ කර තිබිය යුතුය.)

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

<u>පිරිවැය අවම කිරීමේ වැඩසටහන්</u>

**A.06.02** වෙන්කල ලකුණු උපරිමය 08කි. පිරිවැය අවම කිරීම සඳහා යොදා ඇති වැඩසටහන් වෙනුවෙන් ලකුණු ලබා දීම සිදු කෙරේ. පිරිවැය අවම කිරීමේ නව්‍යකරණ වැඩසටහන් සහ නිර්මාණකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇති බව තහවුරු කළ යුතුවේ.

නව්‍යකරණ හෝ නිර්මාණකරණ වැඩසටහන් සඳහා එක් වැඩසටහනකට ලකුණු 04 බැගින් උපරිමය ලකුණු 08කි.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**ආයතනික පරිසර සකස්වීමේ නවයකරණ හා නිර්මාණකරණය**

**A.06.03** වෙන්කල ලකුණු උපරිමය 08 කි. ආයතනික පරිසරය නවයකරණ හා නිර්මාණකරණ මට්ටම නිරීක්ෂණය කිරීමෙන් ලකුණු ලබා දේ.

ආයතනික පරිසරයේ නවයකරණය සතුටුදායක නම් ලකුණු 04
ආයතනික පරිසරයේ නවයකරණය සාමාන්‍ය නම් ලකුණු 02
ආයතනික පරිසරයේ නිර්මාණකරණය සතුටුදායක නම් ලකුණු 04
ආයතනික පරිසරයේ නිර්මාණකරණය සාමාන්‍ය නම් ලකුණු 02
නිරීක්ෂණ මට්ටමින් ලකුණු ලබාදීම සිදු කෙරේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**ආයතනික ප්‍රතිරූපය ගොඩනැගීම**

**A.06.04** වෙන්කල ලකුණු උපරිමය 06කි. ආයතනික ප්‍රතිරූපය ගොඩනැගීම සඳහා ක්‍රියාත්මක කල වැඩසටහන් නිරීක්ෂණය කිරීම තුළින් ලකුණු ලබා දීම සිදු කෙරේ.

ආයතනික ප්‍රතිරූපය ගොඩනැගීම සඳහා ක්‍රියාත්මක කළ වැඩසටහන් සතුටුදායක නම් ලකුණු 06
සාමාන්‍ය නම් ලකුණු 04

- පාරිභෝගික සත්කාර
- සාමාජික සත්කාර
- සමුපකාර ප්‍රතිපත්ති බලගැන්වීම මුදල් අක්‍රමිකතා, අවභාවිතයන් ලකුණු අඩු වීමට හේතු වේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

| A-6 කොටස මුළු ලකුණු 30 | සමිතිය | වි. 1 | වි. 2 |
|---|---|---|---|
| | | | |

**(5) මානව සම්පත් උපයෝජනය හා සංවර්ධනය**

**පිරිස්බල තක්සේරුවක් තිබීම**

**A.07.01** වෙන්කල ලකුණු උපරිමය 16 කි. ස්වේච්ඡාවෙන් කටයුතු කරයිනම් ව්‍යවස්ථානුකූලව සිදුවීම, සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, කාරක සභාව නිසි අයුරින් පත් කිරීම අනුව නිරීක්ෂණ මට්ටමින් ලකුණු හිමිවේ.

පිරිස්බලය සහිත නම්
පිරිස්බල තක්සේරුව අනුමත වීම ලකුණු 06
පිරිස්බල තක්සේරුව යාවත්කාලීන වීම ලකුණු 04
සේවකයන් අනුයුක්ත වීම ලකුණු 04
වැඩබලන තනතුරු නොමැති වීම ලකුණු 02

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**සේවකයින් බඳවා ගැනීම**

**A.07.02** වෙන්කල ලකුණු උපරිමය 10 කි. පදනම් වර්ෂයට ආසන්න වර්ෂ 03 තුළ සේවකයින් බඳවා ගැනීම විධිමත් කාර්ය පටිපාටිවලට අනුකූලවීම මත ලකුණු හිමි වේ. එම කාලය තුළ සේවකයන් බඳවාගෙන නොමැත්තේනම් සම්පූර්ණ ලකුණු ලබා දේ.
නිරීක්ෂණ මට්ටමින් ලකුණු හිමිවේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

ඉල්ලුම්පත් කැඳවීම ලකුණු 02
ඇගයුම් මණ්ඩලයක් සිටීම ලකුණු 02
විභාගයක්/පරීක්ෂණයක් පැවැත්වීම වීම ලකුණු 03
ප්‍රමුඛතාව අනුව පත් කිරීම ලකුණු 03
ස්වේච්ඡාවෙන් කටයුතු කරයිනම් ව්‍යවස්ථානුකූලව සිදුවීම, සභාපති, ලේකම්, භාන්ඩාගාරික, කාරක සභාව නිසි අයුරින් පත් කිරීම අනුව නිරීක්ෂණ මට්ටමින් ලකුණු හිමිවේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**සේවකයන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම**

**A.07.03** වෙන්කල ලකුණු උපරිමය 07 කි.සමස්ථ කාර්ය මණ්ඩලයේ වෘත්තිය පුහුණු සහතික ලැබූ සේවක සංඛ්‍යාව මත ලකුණු හිමි වේ.
ස්වේච්ඡා නිලධාරීන් නම් අවශ්‍ය පුහුණු ලබා දිය යුතුය.

**දිගුකාලීන පුහුණු වැඩ සටහන් උපරිමය ලකුණු 04 කි.**

සමුපකාර ඩිප්ලෝමා, සමුපකාර උසස් පෙළ , සමුපකාර සාමාන්‍යපෙළ, සහතික පත්‍ර වෘත්තිය පුහුණු ,පරිඝණක පුහුණු හා වෙනත් පුහුණ පදනම් කරගෙන එක් සේවකයෙක් සිටීනම් එක සහතිකයකට ලකුණු 02 බැගින් හිමිවන අතර එක් සේවකයෙකුට වැඩිනම් එක සහතිකයකට ලකුණු 01 බැගින් හිමිවේ.

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**කෙටිකාලීන පුහුණුව වැඩ සටහන් උපරිමය ලකුණු 03 කි.**

**කෙටිකාලීන එක් පුහුණු සහතිකයක් සඳහා එක ලකුණ බැගින් හිමිවේ.** පුහුණුව ලැබූ බව සනාථ කළ යුතුයි.

**සේවක සමාජ සංරක්ෂණ නීති**

**A.07.04** වෙන්කල ලකුණු උපරිමය 07 කි. සමාජ සංරක්ෂණ නීති ක්‍රියාත්මක වීම මත ලකුණු හිමිවේ.
අර්ථසාධක හා සේවා භාරකාර දඩ මුදල් ගෙවා නොමැති නම් ලකුණු 02
විශ්‍රාම පාරිතෝෂික මුදල් අස් වූ සේවකයින්ට ගෙවා තිබීම ලකුණු 02
සේවා භාරකාර අරමුදලට දායක වී තිබීම ලකුණු 02
විශ්‍රාම පාරිතෝෂික වෙන් කිරීම ලකුණු 01

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

| A-7 කොටස මුළු ලකුණු 40 | සමිතිය | වි. 1 | වි. 2 |
|---|---|---|---|
| | | | |

ස්වේච්ඡා නිලධාරීන් නම් සාමාජික සුභ සාධන ක්‍රමවේද ඇත්නම් ලකුණු හිමි වේ.

**(8) භෞතික සම්පත් අත්පත්කර ගැනීම ආරක්ෂාව නඩත්තුව හා සංවර්ධනය**

**A.08.01.** **භෞතික සම්පත් ගොඩනැගීම** වෙන්කල ලකුණු උපරිමය 10 කි.

දේපළ පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම නඩත්තුව සංවර්ධනය සඳහා ගිණුම් කරන ප්‍රතිපත්තියක් සකස් කර තිබීම.
( ලකුණු 03)

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

දේපළ පිරියත හා උපකරණ ලේඛනයක් නඩත්තු කිරීම. ( ලකුණු 03)
භෞතික සම්පත් අත්පත් කර ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම. ( ලකුණු 04)

**A.08.02** **<u>භෞතික සම්පත්වල ආරක්ෂාව සඳහා විධිවිධාන යොදා තිබීම</u>** වෙන්කල ලකුණු උපරිමය 14 කි.

දේපළ පිරියත හා උපකරණ ආරක්ෂාව පිළිබඳ භාරකාරිත්වය පවරා තිබීම ( ලකුණු 05)
දේපළ පිරියත හා උපකරණ රක්ෂණය කිරීම. ( ලකුණු 05)
භෞතික සම්පත් භාරකාරිත්වය ලිඛිතව පවරා තිබීම ( ලකුණු 04)

| සමිතියේ ලකුණු | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**A.08.03** **<u>අනවශ්‍ය භෞතික සම්පත් බැහැර කිරීමේ ක්‍රියාදාමයක් පැවතීම</u>** වෙන්කල ලකුණු උපරිමය 16 කි.

අනවශ්‍ය භෞතික සම්පත් හඳුනා ගැනීම . ( ලකුණු 05)
අනවශ්‍ය භෞතික සම්පත් බැහැර කිරීම සඳහා අනුමැතිය ලබා දීම. ( ලකුණු 05)
භෞතික සම්පත් බැහැර කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා කාරක නියෝග අනුව ක්‍රමානුකූලව කටයුතු කිරීම. ( ලකුණු 06)

| | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

| A-8 කොටස මුළු ලකුණු 40 | සමිතිය | වි. 1 | වි. 2 |
|---|---|---|---|
| | | | |

**(9) කළමනාකරණ නායකත්වය**

**<u>ව්‍යාපාර තත්ව විශ්ලේෂණය</u>**

**A.09.01** වෙන්කල ලකුණු උපරිමය 05 කි. ව්‍යාපාර තත්ව විශ්ලේෂණය කර තිබීම මත ලකුණු හිමිවේ. කළමනාකරණ තීරණ මත සනාථ කළ යුතුවේ.( ප්‍රස්ථාර , අනුපාත ආදිය මගින් )

| | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**<u>දර්ශනය පිළියෙල කිරීම</u>**

**A.09.02** වෙන්කල ලකුණු උපරිමය 05 කි. සංවිධානයේ දර්ශනය පිළියෙල කිරීම කිරීම මත ලකුණු හිමිවේ. කළමනාකරණ තීරණ මත සනාථ කළ යුතුවේ.

| | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

**<u>දර්ශනය ප්‍රචලිත කිරීම</u>**

**A.09.03** වෙන්කල ලකුණු උපරිමය 05 කි. සංවිධානයේ දර්ශනය ප්‍රචලිත කිරීම මත ලකුණු හිමිවේ.කළමනාකරණ තීරණ මත සනාථ කළ යුතු

| | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |

| | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |
| | | |

**<u>මෙහෙවර පිළියෙල කිරීම</u>**

**A.09.04** වෙන්කල ලකුණු උපරිමය 05 කි. සංවිධානයේ මෙහෙවර පිළියෙල කර තිබීම මත ලකුණු හිමිවේ.
කළමනාකරණ තීරණ මත සනාථ කළ යුතුය.

**<u>මෙහෙවර ප්‍රචලිත කිරීම</u>**

**A.09.05** වෙන්කල ලකුණු උපරිමය 05 කි. සංවිධානයේ මෙහෙවර ප්‍රචලිත කිරීම මත ලකුණු හිමිවේ.
කළමනාකරණ තීරණ හා ලිඛිත ප්‍රතිපත්ති මත සනාථ කළ යුතුය.

| | විනිශ්චිත ලකුණු | |
|---|---|---|
| | 1 | 2 |
| | | |

